www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂය ශ්‍රී ලංකා ආන්ඩුව විසින් මැයි දින පෙලපාලි හා රැස්වීම් නැවැත්වීමට කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි

**Socialist Equality Party rejects Sri Lankan government appeal to shut down May Day rallies**

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2006 මැයි 1**

අද දින මැයි දින රැලි නොපවත්වන ලෙස සියලු දේශපාලන පක්ෂවලට ආන්ඩුව විසින් කරන ලද "ඇනවුම" සමාජවාදී සමානතා පක්ෂය (සසප) හෙලා දකී. ජනාධිපති මහින්ද රාජපක්ෂ දිවයින යුද්ධය දෙසට ඇද දමමින් සිටින තතු තුල, ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඓතිහාසික අරගල සමග දීර්ඝ කාලයක් සම්බන්ධව පවත්නා මැයි දින දේශපාලන ක්‍රියාකාරිත්වය යටපත් කර දැමීමට දැරෙන මෙම ප්‍රයත්නය යොමු වී ඇත්තේ කම්කරුවන්ගේ මොනම ස්වාධීන ව්‍යාපාරයක් වුව පාගා දැමීමට ය.

"ආරක්ෂාව" යන හේතුව ඉදිරිපත් කරමින් මැයි දින රැලි අහෝසි කර දැමීමට කරන ඉල්ලීම කම්කරු පන්තියේ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි තව තවත් ප්‍රහාරයන් සකසමින් පවතින බවට තියුනු අනතුරු ඇඟවීමකි. දැනට ම ජීවිත 65,000කට අධික සංඛ්‍යාවක් විනාශ කර ඇති ප්‍රතිගාමී වර්ගවාදී යුද්ධය සඳහා තව දුරටත් කැප කිරීම් කිරීමට වැඩ කරන ජනතාව යලිත් වරක් කැඳවනු ලබනු ඇත.

ආන්ඩුවේ හා විපාර්ශ්වයේ සියලු ම ප්‍රධාන පක්ෂ කෙඳිරියකින් හෝ තොරව ආන්ඩුවේ පිලිවෙතට අනුගත වී සිටිති. කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතය ම නව රුධිර ස්නානයකට ද "ජාතිය ආරක්ෂා කිරීමේ" නාමයෙන් ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට හා ජීවන කොන්දේසිවලට විරුද්ධ ප්‍රහාර ක්‍රියාත්මක කිරීමට ද එක්ව සැරසෙමින් සිටී.

"ආරක්ෂාව" පිලිබඳව ආන්ඩුවේ ව්‍යාජ හේතුව මුලුමනින් ම නරුම ය. උතුරේ හා නැගෙනහිරේ වැඩි වැඩියෙන් උත්සන්න වන ප්‍රචන්ඩ ක්‍රියා මාලාවක් ඇති කොට විවෘත යුද්ධයේ අන්තරාය ඉස්මතු කරන්නා වූ අන්දමින් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග වර්තමාන උග්‍ර ආතතිය නිර්මානය කිරීමට පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) වගකිව යුතු ය.

රාජපක්ෂ පසු ගිය නොවැම්බර් මාසයේ ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ සිංහල අන්තවාදීන්ගේ ආධාරයෙන් ජනාධිපතිවරනය ජයගත්තේ යන්තමිනි. 2002 සටන් විරාම ගිවිසුම සංශෝධනය කිරීමට ද "සාම ක්‍රියාවලියේ" නිල පහසුකම් සපයන්නාගේ ක්‍රියාකලාපයෙන් නෝර්වේ රාජ්‍යය ඉවත් කර දැමීමට ද ඔවුන් කර ඇති ඉල්ලීම් අර්ථවත් සාකච්ඡාවක් යලි පටන් ගැනීම පිලිබඳ ඉදිරි බලාපොරොත්තු නියතයෙන් ම විනාශ කර ඇත.

ආන්ඩුව ද ආරක්ෂක බලකායන් ද ඔවුන්ගේ සිංහල ජාත්‍යොත්තමවාදී මිත්‍රයන් ද පෙබරවාරි මාසයේ පවත්වන ලද ප්‍රථම ජිනීවා සාකච්ඡා වටයේ පටන් ම දෙවන සාකච්ඡා වටයක් ඇති වීම වලක්වාලීම සඳහා එක් ප්‍රකෝපකරනයකට පසු තවත් ප්‍රකෝපකරනයක් නිර්මානය කරමින් කුමන්ත්‍රනය කර තිබේ. පසු ගිය අවුරුදු තුන ඇතුලත කර ගෙන ගිය පරිදි එල්ටීටීඊ නායකයන් නැගෙනහිර සිට වන්නියේ ඔවුන්ගේ මධ්‍යස්ථානය කරා ප්‍රවාහනය කිරීම තව දුරටත් කිරීමට සූදානම් නැතැයි පසු ගිය මාසයේ දී මිලිටරිය ප්‍රකාශ කලේ ය.

අප්‍රේල් 7 දා, දෙවන ජිනීවා සාකච්ඡා වටයට සති දෙකකටත් වඩා අඩු කාලයකට පෙර, වී. විග්නේස්වරන් නමැති එල්ටීටීඊයට පක්ෂ ප්‍රමුඛ දේශපාලනඥයා ත්‍රිකුනාමලයේ දී මහ දවාලේ මරා දමන ලදි. මෙම ඝාතනය පිලිබඳව විරෝධතා පවත්නා තතු ඇතුලත, එම නගරයේ ම වෙලඳ පොලක දී බෝම්බයක් පුපුරුවා දැමීමෙන් ඉක්බිතිව දෙමල ජනයාට විරුද්ධව වර්ගවාදී සැඩ පහරක් මුදා හරින ලදි. පසු ගිය මාසය ඇතුලත ජීවිත 100කට වඩා විනාශ කරමින් දෙවන ජිනීවා සාකච්ඡා වටය අහෝසි කල ප්‍රචන්ඩත්වයේ රැල්ල අවුලුවාලීම සඳහා සන්නද්ධ හමුදාවේ කොටස් ද දෙමල අර්ධ-මිලිටරි බලකායන් ද සිංහල ජාත්‍යොත්තමවාදින් ද ඇතුලත් යටිකූට්ටු සන්ධානයක් ක්‍රියාත්මකව ඇති බවට සැකයක් නැත.

මෙසේ මාස ගනනාවක් තිස්සේ එල්ටීටීඊය ප්‍රකෝපයට පත් කර උසිගන්වා ගෙන ගිය තතු තුල, දඩි පිලිවෙත්ධාරියකු වූ යුද හමුදාපති සරත් ෆොන්සේකා ඉලක්ක කර ගත් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් තුලින් පසු ගිය අප්‍රේල් 25 දා එල්ටීටීඊය ප්‍රතිචාර දැක්වීම පුදුමයක් නොවී ය. සහතිකයෙන් ම එල්ටීටීඊය විසින් සිදු කරන ලද්දේ යැයි පෙනී ගිය මෙම ප්‍රහාරය වනාහි එම සංවිධානයේ දේශපාලන බංකොලොත්කම තව දුරටත් ඔප්පු කරන්නකි. කොලඹ ධනේශ්වර දේශපාලන සංස්ථාපිතයේ පාර්ශ්වකරුවන්ට මෙන් ම එල්ටීටීඊයට ද වැඩ කරන ජනතාවගේ හදිසි සමාජ අවශ්‍යතාවන්ට විසඳුමක් ඇත්තේ නැත. එහෙයින් එල්ටීටීඊය කම්කරු පන්තිය වර්ගවාදී ආකාරයට බෙදාලීම සඳහා සිංහල විරෝධී ජාත්‍යොත්තමවාදය අවුලුවාලයි.

මේ දෙපාර්ශ්වයෙන් ම යුද්ධය සඳහා සෝෂාව උග්‍ර කෙරෙන්නේ සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරුවන් තුල තමන්ගේ ජීවන තත්වයන් දිගින් දිගට ම විනාශ කිරීමට එරෙහිව නැගෙන විරෝධය ගැඹුරු වන තතු තුල වීම අහම්බයක් නොවේ. තමා "සාමයේ මිනිසකු" යැයි රාජපක්ෂ කරන බොරු කියාපෑම මෙන් ම වැඩ කරන ජනතාවට සහන සපයන්නේ යැයි ඔහු මැතිවරනයේ දී දුන් පොරොන්දු ද බොරු බව ඔප්පු වී ඇත. වේගයෙන් ඉහල යන ජීවන වියදමට මුහුන දී ගැනීම සඳහා සාධාරන වැටුපක් ලබා ගැනීමට ලක්ෂ සංඛ්‍යාත රාජ්‍ය අංශයේ කම්කරුවෝ ව්‍යායාමයක යෙදී සිටියාහ. මුදල් සහ වෙනත් ආකාර ගම්බද සහනයන් කප්පාදු කිරීමට ආන්ඩුව වැඩට බැස ගෙන සිටින තතු තුල තමන්ගේ භාන්ඩවලට යහපත් මිලක් ලබා ගැනීම සඳහා දුප්පත් ගොවියෝ උග්‍ර ව්‍යායාමයක් දියත් කර සිටිති.

1948 ස්වාධීනතාවයේ පටන් මෙවන් තත්වයක් උද්ගත වූ සෑම අවස්ථාවක දී ම, පාලක පන්තීන්ට කම්කරු පන්තියේ ව්‍යාපාරයට එරෙහිව පැවතී තිබෙන්නේ එක ම එක ප්‍රතික්‍රියාවකි. එනම්, ධනවාදයට එරෙහි ඒකාබද්ධ අරගලයක් වැලැක්වීම සඳහා වර්ගවාදී හලාහල විෂ වගුරුවාලීම ය. රාජපක්ෂ නොකැමති ම දෙය නම්, කම්කරුවන් සහ නාගරික හා ගම්බද දුප්පත් ජනතාව විසින් දරා සිටින කෝපය සහ විරෝධය ඒකරාශී වීමේ කේන්ද්‍රය ලෙස 2006 මැයි දිනය ඉස්මත්තට ඒම ය. කම්කරුවන් වෙනුවෙන් තමන් කතා කරන්නේ යැයි බොරුවට කියා පාන්නා වූ ජවිපෙ, ලංකා සමසමාජ පක්ෂය (ලසසප), කොමියුනිස්ට් පක්ෂය (කොප) සහ වෘත්තීය සමිති නායකත්වයෝ, මෙම සොරතර පන්ති බෙදීමේ දී ආන්ඩුව සමග එක කඳවුරේ සිටිති.

කම්කරු පන්තිය සන්ධිස්ථානයක් කරා එලඹ සිටී. දිවයින යලිත් වරක් යුද්ධයකට ඇද දැමීමට සූදානම් වන පාලක පන්තියේ දේශපාලන නියෝජිතයෝ ඒ සමග ම කම්කරු පන්තියේ සමාජ තත්වයන්ට එරෙහි පන්ති යුද්ධයක් සකසමින් සිටිති. මෙම සූදානමත් විදේශීය ආයෝජකයන් විසින් බලකර ඉල්ලා සිටින ගැඹුරට ම කපා ගෙන යන්නා වූ ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ වැඩපිලිවෙලක් සඳහා බිම සකස් කර ගැනීම අරමුනු කර ගෙන ආන්ඩුව සහ එල්ටීටීඊය අතර සාකච්ඡා මගින් සමථයක් ඇති කිරීම පිනිස අධිරාජ්‍යවාදී බලවතුන් ද කොලඹ මහ කොම්පැනිවල ප්‍රභූන් ද විසින් උසිගන්වා තිබෙන ඊනියා සාම ක්‍රියාවලියත් එක ම කාසියේ දෙපැත්ත ය.

සසප අද දින කොලඹ දී තම මැයි දින රැලිය පවත්වන්නේ කම්කරු පන්තිය සඳහා අවශ්‍ය සමාජවාදී විකල්පය උදෙසා සටන් කිරීමට ය. වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන් ද ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ද ආරක්ෂා කිරීමට කෙරෙන ඕනෑම අරගලයක ප්‍රථම පියවර වන්නේ පාලක පන්තියේ සියලු පක්ෂවලින් සහ කන්ඩායම්වලින් මුලුමනින් ම දේශපාලනිකව බිඳී වෙන් වී සකල ආකාර ජාතිකවාදය, වර්ගවාදය සහ ජාත්‍යොත්තමවාදය ප්‍රතික්ෂේප කිරීම ය. කම්කරු පන්තියේ අතීත පරම්පරාවන් විසින් සටන් කොට දිනා ගනු ලැබූ මැයි දින රැලි පැවැත්වීමේ අයිතිය අතහැර දමන ලෙස ආන්ඩුව කරන ඇනවුම ඉවත දැමීම "දේශද්‍රෝහී" යැයි හෙලා දකින්නන් කම්කරුවන් විසින් පිලිකුලෙන් යුතුව ප්‍රතික්ෂේප කල යුතු ය.

සසප යුද්ධයට, සමාජ අසමානතාවට සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට විරුද්ධ ප්‍රහාරයන්ට එරෙහිව පන්ති විසඳුමක් ඉදිරිපත් කරයි. අපි දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් කොලඹ ධනේශ්වර ආන්ඩුවට ද ධනේශ්වර ජාතිකවාදී එල්ටීටීඊයට එරෙහිව එක්සත් කිරීම සඳහා පදනමක් ලෙස පහත සඳහන් ඉල්ලීම ඉදිරිපත් කරමු: උතුරේ හා නැගෙනහිරේ යුද කලාපවලින් සියලු ආරක්ෂක හමුදා වහාම කොන්දේසි විරහිතව ඉවත් කර ගනු.

ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ සකල නොවිසඳුනු ප්‍රශ්න විසඳාලීම ද සකල ආකාර වෙනස්කම් කිරීම් නවත්වාලීම සඳහා ද නව ව්‍යවස්ථාවක් අවශ්‍ය යැයි සසප කියා සිටී. එහෙත් ව්‍යවස්ථාව සකස් කිරීම ප්‍රජාතන්ත්‍රවාදීව කල යුත්තකි. 1972 දී සහ 1978 දී මෙන් පවත්නා පාර්ලිමේන්තුව වංචාකාරී ලෙස ව්‍යවස්ථා සම්පාදක මන්ඩල බවට පරිවර්තනය කර ගත්තා මෙන් නොව, ව්‍යවස්ථා සම්පාදනය යන එම සුවිශේෂ කර්තව්‍යය සඳහා ම වැඩ කරන ජනතාව විසින් ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කර ගනු ලැබූ සැබෑ ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් විසින් මෙම නව ව්‍යවස්ථාව කෙටුම්පත් කොට සම්මත කර ගත යුත්තේ ය.

සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය යනු සෑම විටම ධනවතුන්ට හා වරප්‍රසාදිතයන්ට වාසි ලබා දෙන්නා වූ ධනේශ්වර නීති පද්ධතියේ ද පාර්ලිමේන්තු මැතිවරනවල ද රූපික සමානතාවට වඩා වැඩි දෙයකි. සමාජ ආර්ථික පදනම පලල් වැඩ කරන මහා ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු

කර ලීම සඳහා ප්‍රතිවර්තනය කල යුතු ය. සියලුම ප්‍රමුඛ මූල්‍ය, කාර්මික සහ වානිජ ව්‍යවසායන් ප්‍රජාතන්ත්‍රවාදී මහජන අයිතිය හා පරිපාලනය යටතේ තබමින් එමගින් ඒවා ධනහිමි අතලොස්සකගේ ලාභ සඳහා නොව සමාජයේ අති මහත් බහුතරයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පවත්වා ගෙන යන්නා වූ සමාජවාදී වැඩපිලිවෙලක් උදෙසා සසප සටන් වදින්නේ ඒ නිසා ය.

දකුනු ආසියාවේ කුඩා දිවයිනක් තුල පමනක් නොව, ලෝකයේ ඕනෑම කුඩා හෝ විශාල තනි ජාතික රාජ්‍යයක් තුල සමාජවාදය දිනා ගත නොහැකි ය. සමාජවාදය සඳහා අරගලය අවශ්‍යයෙන් ම ජාත්‍යන්තර ය. ගෝලීය ධනවාදයේ කොල්ලකාරී ක්‍රියාකාරිත්වයට එකම විකල්පය වන්නේ, සමාජය සමාජවාදී පිලිවෙතක් මත යලි සැකසීම සඳහා කම්කරු පන්තිය විසින් ඒකාබද්ධ ජාත්‍යන්තර ප්‍රතිප්‍රහාරයක් දියත් කිරීම ය. ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා වූ අරගලය වනාහි දකුනු ආසියාවේ එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා ද ජාත්‍යන්තරව ද ගෙන යන්නා වූ වඩා පලල් අරගලයක සංරචකයක් පමනි. සසප විසින් ද හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සියලු ම ශාඛාවන් විසින් ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* තුලින් ද සටන් වදින්නා වූ ක්‍රියා මාර්ගය මෙය යි.

මැයි දිනයේ දී සියලු දේශපාලන ක්‍රියාකාරකම් නවත්වන ලෙස දූන් ආන්ඩුව නිකුත් කර ඇති ඇනවුමට විරුද්ධව කම්කරුවන්, තරුන ජනයා, ගෘහනීන් හා බුද්ධිමතුන් නැගී සිටින ලෙස ද තීරනාත්මක දේශපාලන ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා කොලඹ ග්‍රීන් පාත්හි නව නගර ශාලාවේ පැවැත්වෙන්නා වූ සසප මැයි දින රැලියට සහභාගි වන ලෙස ද අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org